පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 1 (1 වාරය)

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## සංඛ්‍යා රටා

### 1.1 සංඛ්‍යා රටා සහ සංඛ්‍යා රටාවක පද

- යම් සංඛ්‍යාවකින් ආරම්භ කර, යම් නිශ්චිත ක්‍රමයකට හෝ රීතියකට හෝ පේළියක අනුපිළිවෙළින් ලියන ලද සංඛ්‍යා සමූහයකට **සංඛ්‍යා රටාවක්** ලෙස හැඳින්වේ.
- සංඛ්‍යා රටාවක පිහිටා ඇති සෑම සංඛ්‍යාවක් ම එම **සංඛ්‍යා රටාවේ පදයක්** ලෙස හැඳින්වේ. එහි ආරම්භක පදය **පළමු වන පදය** ලෙසත්, ඊළඟට ඇති පද දෙවැනි, තුන්වැනි පදය ආදී ලෙස නම් කරයි. සංඛ්‍යා රටාවක පද වෙන් කර හඳුනාගැනීම සඳහා පද අතර කොමා යොදනු ලැබේ.
- පෙළ පොතේ 1,2 පිටු අධ්‍යයනය කර, **පරිමිත සංඛ්‍යා රටා** සහ **අපරිමිත සංඛ්‍යා රටා** සඳහා උදාහරණය බැගින් ඉදිරිපත් කරමින් විස්තර කරන්න.
- 1.1 අභ්‍යාසය කරන්න.

### 1.2 සංඛ්‍යා රටාවක පොදු පදය

- සංඛ්‍යා රටාවක n වන පදය n ඇසුරෙන් වූ වීජීය ප්‍රකාශනයකින් ප්‍රකාශ කළ විට එය එම සංඛ්‍යා රටාවේ පොදු පදය හෝ සාධාරණ පදය ලෙස හැඳින්වේ.

  2, 4, 6, 8, ...යන දෙකෙහි ගුණාකාර රටාව හෙවත් ඉරට්ට සංඛ්‍යා රටාව සලකමු.

  | | | |
  |---|---|---|
  | පළමු වැනි පදය | $2\times1$ | $= 2$ |
  | දෙවන පදය | $2\times2$ | $= 4$ |
  | තුන්වැනි පදය | $2\times3$ | $= 6$ |
  | n වැනි පදය | $2\times n$ | $=2n$ |

  දෙකෙහි ගුණාකාර රටාව හෙවත් ඉරට්ට සංඛ්‍යා රටාවේ පොදු පදය = $2n$
- පෙළ පොතේ 4,5 පිටු අධ්‍යයනය කර ඉහත ආකාරයට තුනේ ගුණාකාර රටාවේ, හතරේ ගුණාකාර රටාවේ, හතේ ගුණාකාර රටාවේ පොදු පදය ලබා ගන්නා ආකාරය ලියන්න.
- පෙළ පොතේ 6, 7 පිටු අධ්‍යයනය කර 1.2 අභ්‍යාසය කරන්න.